Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

# කෘෂි සංචාරණය දියුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පවතින විභවතාවයන් පිළිබඳ අධ්‍යයනයක්

*ඒ. අයි. උමයන්ගනී* [1]

සංක්ෂේපය

ගොවිතැන් කටයුතු හා සම්බන්ධ ක්‍රියාකාරකම් විවිධාංගීකරණය කිරිම තුළින් හා සංචාරකයන් සදහා විවේකය, විනෝදාස්වාදය සැපයීම හා ගොවිතැන පිළිබඳ අධ්‍යයනය කිරීමට අවස්ථාව ලබාදීම තුළින් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා දායක විය හැකි වැදගත් උපක්‍රමයක් ලෙස කෘෂි සංචාරණය හදුනාගෙන ඇත. වර්තමානයේදී ලොව බොහෝ රටවල් තිරසර ග්‍රාමීය සංවර්ධනය ඉලක්ක කරගනිමින් කෘෂි සංචාරණය ආරම්භ කර තිබේ. ශ්‍රී ලංකාව කෘෂිකාර්මික රටක් වශයෙන් දේශීය තත්වයන් යටතේ ග්‍රාමීය සංවර්ධනය සඳහා කෘෂි සංචාරණය දියුණු කිරීමට විභවතාවන් තිබේද යන්න පිළිබඳව අවධානය යොමු කිරීමට දැන් කාලය එළඹී ඇත.

ග්‍රාමීය සංවර්ධන උපක්‍රමයක් ලෙස කෘෂි සංචාරණය යොදාගැනීම සඳහා ශ්‍රී ලංකාවේ ඉහළ විභවතාවක් පැවතුණද තවමත් සැලකිය යුතු මට්ටමකින් රට තුළ කෘෂි සංචාරණය සංවර්ධනය වී නැත්තේ මන්ද යන්න මෙහිදී අධ්‍යයන ගැටලුව වශයෙන් පෙන්වාදිය හැකිය. මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණ වූයේ ග්‍රාමීය සංවර්ධන උපක්‍රමයක් ලෙස කෘෂි සංචාරණය දියුණු කිරීම සදහා ශ්‍රී ලාංකේය රාමුව තුළ පවතින විභවතාව නිශ්චය කිරීමයි. මෙහිදී පර්යේෂණ ක්‍රමවේදය ලෙස ක්ෂේත්‍ර සමීක්ෂණ ක්‍රමය යොදාගත් අතර දත්ත රැස් කිරීමේදී ප්‍රශ්නාවලි ක්‍රමය හා සම්මුඛ සාකච්ජා ක්‍රමය භාවිතා කරමින් ශ්‍රී ලංකාවේ රත්නපුර දිස්ත්‍රික්කයේ, කලවාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රධාන සංචාරක ආකර්ෂණයක් වන ලෝක උරුම සිංහරාජ වන පෙත ආසන්නයේ පිහිටි කුඩව ග්‍රාම නිලධාරී වසමෙහි පදිංචි කෘෂි කර්මාන්තයෙහි නියැලෙන පවුල් 30 ක නියැදියක් ඇසුරින් සිදු කරන ලදි. මෙහිදී ප්‍රශ්නාවලි මගින් ලබාගත් දත්ත ප්‍රමාණාත්මක විශ්ලේෂණයද සම්මුඛ සාකච්ජා මගින් ලබාගත් දත්ත ගුණාත්මක විශ්ලේෂණයද කරන ලදී.

මෙමගින් ප්‍රදේශය තුළ කෘෂි සංචාරණය දියුණු කිරීම සඳහා විභවතාවයන් කිහිපයක්ම පවතින බව අනාවරණය විය. කෙසේ නමුත් ප්‍රදේශයෙහි කෘෂි සංචාරණය සංවර්ධනය සඳහා බාධක වශයෙන් යටිතල පහසුකම් සංවර්ධනය වී නොතිබීම, කෘෂි සංචාරණය හා ඉන් ලබාගත හැකි ප්‍රතිලාභ පිළිබඳ ගොවීන් තුළ ඇති නොදැනුවත් භාවය, අවශ්‍ය මූල්‍ය පහසුකම් නොමැතිවීම, ගොවීන් සතුව කළමණාකරණ හා ව්‍යවසායකත්ව හැකියාවන් නොමැතිවීම ආදිය පවතී.

ප්‍රමුඛ පද : කෘෂි සංචාරණය, ග්‍රාමීය සංවර්ධනය, ගොවිපොළ විවිධාංගීකරණය

1 *ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව;* Imesha92u@gmail.com